## බිරිඳ සහ පවුලේ අයවලුන් විසින් දැනුවත් විය යුතු කරුණු කාරණා

ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳී විවාහ දිවියට පත්ව දූ දරුවන් ලැබ විශ්‍රාම ලබා සිටිනා අප කවුරුත් තම බිරිඳ සමග සියළුදේ ගැන කථා කලත් ඇය අකමැති මෙන්ම කථා කිරීමට ඉඩ ප්‍රස්ථා නොදෙන විෂයක් වන්නේ ස්වාමිපුරුෂයාගේ මරණය සහ ඉන්පසු බිරිඳ හෝ දරුවන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න ගැන කථා කිරීමටයි.

කොපමණ අකමැති වුවත් අප බිරින්දෑවරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් විය යුත්තේ ඇයට අනිවාර්යෙන්ම මුහුණදීමට සිදුවන එවැනි මොහොතකදී ගතයුතු ක්‍රියාමාර්ගයන් ක්‍රමවත්ව කිරීමට උපකාරී වන හෙයිනි. අප මෙහි සඳහන් කිරීමට බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයෙන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ඉටුකරගත යුතු කාර්යන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමකි.

### අවසන් ගෞරව සේවා අවමංගල්‍ය

වසර 22 ක ගෞරවනීය සේවයෙන් පසු විශ්‍රාම ගිය නාවිකයින් සඳහා පහත සඳහන් අවමංගල්‍යාචාරය හිමිවනු ඇත. එහෙත් වෛද්‍යමය හේතූන් මත විශ්‍රාමගැන්වූ නාවිකයින් හට මෙම අවමංගල්‍යාචාරය හිමි නොවන අතර ක්‍රියාන්විතයේදී ආබාධිතව විශ්‍රාම ගොස් සිටින නාවිකයින් හට මෙම අවමංගල්‍යාචාරය හිමිවනු ඇත.

- Firing Party
- Two Buglers
- Bearer Party
- Insignia Party
- Mourners (as nominated by the respective Service)

### අවසන් ගෞරව සේවා අවමංගල්‍ය උත්සවයක් සහ සේවාවන් ඉල්ලුම් කිරීම

නාවික හමුදාවේ විනයගරුක මනා සේවයක් ඉටුකර විශ්‍රාම ගත් නාවික පුද්ගලයින් හට පමණක් ඔවුන් මිය යෑමේදී සේවා අවමංගල්‍යයක් ලබාදීම නාවික හමුදාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව නාවික හමුදාව මගින් සිදුකරනු ලබන අතර ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් ලබාදෙන සේවාවන් (20' X 20' කූඩාරමක්, ප්ලාස්ටික් පුටු 50 ක් හා නෙස්කැෆේ මැෂිමක්) වේ. තවද රු. 20,000.00 ක මරණ පාරිතෝෂික දීමනාවක් ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකත්වය ඇති සියළු සාමාජිකයින් හට ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින් ලබාදෙනු ඇත. මෙසේ සේවා අවමංගල්‍යයක් හා සේවාවන් ලබාගැනීමට අදහස් කරන්නේනම් මියගිය නාවික පුද්ගලයාගේ බිරිඳ/පවුලේ සාමාජිකයෙකු විසින් කලයුතු වන්නේ නාවික පුද්ගලයා මියගිය බව නොපමාව මරණ සහතිකයේ පිටපතක්ද සමග පහත සඳහන් ආකෘතිය පරිදි සකසන ලද ලිපියක් මගින් ලගම ඥාතියාගේ ලිඛිත ඉල්ලීමක් 011–7193971 වෙත ෆැක්ස් පණිවිඩයක් හෝ පහසු මාධ්‍යයක් මගින් දැනුම්දීමයි.

---

.........................................
.........................................
.........................................
2017/    /

ගරු සභාපතිතුමා
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
ශ්‍රීලංනානෞ ගැමුණු
වැලිසර

**සේවා අවමංගල්‍යයක්/ අවමංගල්‍යය සේවාවන් ලබාගැනීම**

නාවික හමුදාවේ හිටපු (නම : ........................ /නිල අංකය : ................) වූ මාගේ ස්වාමිපුරුෂයා 2017/    / වන දින මියගිය බව කණගාටුවෙන් දන්වමි. එබැවින් සේවා අවමංගල්‍යයක් සහ ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් හට අවමංගල්‍ය අවස්ථාවන්වලදී ලබා දෙන සේවාවන් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. අවමංගල්‍ය කටයුතු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදිවේ.

(1). ලගම ඥාතියාගේ නම සහ ඥාති සම්බන්ධතාවය හා දුරකථන අංකය
(2). අවමංගල්‍ය සිදු කරන ස්ථානයේ (නිවසේ) ලිපිනය
(3). ගමන් විස්තරය (නිවසට පැමිණියයුතු ආකාරය කෙටියෙන් සඳහන් කරන්න)
(4). අවසන් කටයුතු පවත්වන දිනය, ස්ථානය සහ වේලාව
(5). ආදාහනය කරනවාද භූමදානය කරනවාද යන වග
(6). ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින් ලබාදෙන සේවාවන් අවශ්‍ය වන කාලසීමාව

ස්තුතියි
මෙයට